# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2199/10 - 2020 ඔක්තෝබර් මස 27 වැනි අඟහරුවාදා - 2020.10.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 924/2 දරන හා 1996 මැයි මස 20 වැනි දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය හා එයට වරින් වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 ඔක්තෝබර් මස 26 දින

**01. ක්‍රියාත්මක වන දිනය :**

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2020.10.27 දින සිට ක්‍රියාත්මක විය යුතුයි.

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරනු ලැබූ සෞඛ්‍ය සේවා කමිටුව

**03. සේවා ශ්‍රේණිය / සේවා ශ්‍රේණි :**

**3.1 සේවා ශ්‍රේණිය** : වෛද්‍ය නිලධාරි
විධායක
ජ්‍යෙෂ්ඨ විධායක




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**3.2 ශ්‍රේණි :** වෛද්‍ය නිලධාරි - ප්‍රාථමික ශ්‍රේණිය
දෙවන ශ්‍රේණිය
පළමු ශ්‍රේණිය

විධායක - පරිපාලන I ශ්‍රේණිය
පරිපාලන II ශ්‍රේණිය

ජ්‍යෙෂ්ඨ විධායක - විශේෂඥ ශ්‍රේණිය

**04. කාර්යභාරය :**

දීප ව්‍යාප්ත සේවාවක් වන ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවාව මගින් සෞඛ්‍ය කෙරෙහි හානිකර ලෙස බලපාන්නා වූ සාධක හඳුනා ගනිමින් විශේෂඥ සේවාවන් ද සහිතව රෝග නිවාරණ සහ ප්‍රතිකාර සේවා ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය සඳහා වන ගැටළු පුරෝකථනය කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම, සෞඛ්‍ය අධ්‍යාපනය, පර්යේෂණ කටයුතු, ප්‍රජා සෞඛ්‍ය කටයුතු, ඖෂධ නිෂ්පාදන, කළමනාකරණය, ප්‍රමිතිකරණය, ඖෂධ වගාව, ආයුර්වේද සේවා කළමනාකරණය යන අංශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයුර්වේද/සිද්ධ/ යුනානි, දේශීය චිකිත්සා, යන අංශ එක්ව ක්‍රියාත්මක වීම ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ පොදු කාර්ය භාරය වේ.

**05. වැටුප්**

**5.1 වැටුප් කේත අංකය :**

SL2 - 2016 (ප්‍රාථමික ශ්‍රේණිය, II ශ්‍රේණිය හා I ශ්‍රේණිය)
SL1 - 2016 (පරිපාලන II ශ්‍රේණිය I ශ්‍රේණිය)
SL3 - 2016 (විශේෂඥ ශ්‍රේණිය)

**5.2 වැටුප් පරිමාණය :**

SL2 - 2016 - රු. 52955 - 3 X 1335 - 7 X 1345 - 2 X 1630 - 16 X 2170 - 104355
SL1 - 2016 - රු. 47615 - 10 X 1335 - 8 X 1630 - 17 X 2170 - 110895
SL3 - 2016 - රු. 88000 - 12 X 2700 - 120400

**5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :**

| ශ්‍රේණිය | වැටුප් කේත අංකය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|---|
| ප්‍රාථමික ශ්‍රේණිය | SL 2 - 2016 | පියවර 02 | රු. 54, 290 |
| II ශ්‍රේණිය | SL 2 - 2016 | පියවර 05 | රු. 58, 305 |
| I ශ්‍රේණිය | SL 2 - 2016 | පියවර 14 | රු. 71, 805 |
| පරිපාලන II ශ්‍රේණිය | SL 1 - 2016 | පියවර 12 | රු. 62, 595 |
| පරිපාලන I ශ්‍රේණිය | SL 1 - 2016 | පියවර 20 | රු. 76, 175 |
| විශේෂඥ ශ්‍රේණිය | SL 3 - 2016 | පියවර 01 | රු. 88, 000 |

**06. සේවාවට අයත් තනතුරු**

**6.1 අනුමත ශ්‍රේණි, තනතුරු-නාම හා සංඛ්‍යාව**

| තනතුර අනුමත ශ්‍රේණි | තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| පරිපාලන I ශ්‍රේණිය | අධ්‍යක්ෂ - ආයුර්වේද ශික්ෂණ රෝහල් | 04 |
| | අධ්‍යක්ෂ - ආයුර්වේද පර්යේෂණ රෝහල් | 04 |
| | පළාත් ආයුර්වේද කොමසාරිස් | 09 |
| පරිපාලන II ශ්‍රේණිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ - ආයුර්වේද ශික්ෂණ රෝහල් | 02 |
| | අධ්‍යක්ෂ - ආයුර්වේද පර්යේෂණ රෝහල් | 01 |
| | පළාත් නියෝජ්‍ය/සහකාර ආයුර්වේද කොමසාරිස් | 10 |
| | අධ්‍යක්ෂ පළාත් ආයුර්වේද රෝහල් | 03 |
| | සහකාර කොමසාරිස් (ශිල්පීය) | 01 |
| | සහකාර අධ්‍යක්ෂ (ශිල්පීය අධ්‍යාපන) | 01 |
| විශේෂඥ වෛද්‍ය නිලධාරි ශ්‍රේණිය | විශේෂඥ වෛද්‍ය නිලධාරි | 121 |
| වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය | කාර්ය භාර වෛද්‍ය නිලධාරි | 04 |
| | අධීක්ෂණ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි | 09 |
| | වෛද්‍ය අධිකාරි (ආයුර්වේද) | 24 |
| | ස්ථාන භාර වෛද්‍ය නිලධාරි-(ඖෂධ නිෂ්පාදන ඒකක | 11 |
| | ප්‍රධාන නාගරික ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 02 |
| වෛද්‍ය නිලධාරි ප්‍රාථමික හා II ශ්‍රේණි | විද්‍යාඥ (උද්භිද විද්‍යා/රසායන විද්‍යා) | 02 |
| | ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි | 22 |
| | කථිකාචාර්ය | 05 |
| | වෛද්‍ය නිලධාරි (අධ්‍යයන) | 05 |
| | වෛද්‍ය නිලධාරි (විමර්ශන) | 01 |
| | ආයුර්වේද වෛද්‍ය නිලධාරි | 1680 |
| | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් | 832 |

**6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :**

| | |
|---|---|
| පරිපාලන I ශ්‍රේණිය | 17 |
| පරිපාලන II ශ්‍රේණිය | 18 |
| විශේෂඥ වෛද්‍ය නිලධාරි ශ්‍රේණිය | 121 |
| වෛද්‍ය නිලධාරි I ශ්‍රේණිය | 50 |
| වෛද්‍ය නිලධාරි ප්‍රාථමික හා II ශ්‍රේණි | 2547 |

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීම සඳහා ප්‍රාථමික, II හා I ශ්‍රේණිය, ඒකාබද්ධ සංඛ්‍යාවට අයත් ලෙස සැලකේ.

**6.3 තනතුරෙහි / තනතුරු වල ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

**සටහන** - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

**7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :**

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත | 100 % |
| සීමිත | අදාල නොවේ |
| කුසලතා | අදාල නොවේ |

**7.2 විවෘත බඳවා ගැනීම**

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ආයුර්වේද/සිද්ධ/යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස් අවුරුදු උපාධියකින් පසුව එක් අවුරුදු සීමාවාසික රෝහල් පුහුණුවක් ලබා තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.2.2.4 කායික සුදුසුකම් :

සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

7.2.2.5 වෙනත් :

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ආ) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
(ඇ) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

**7.2.3 වයස :**

7.2.3.1 අවම සීමාව : අවුරුදු 22 යි
7.2.3.2 උපරිම සීමාව : අවරුදු 45 යි

**7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද/සිද්ධ/යුනානි උපාධිය ලත් උපාධිධාරීන් අදාළ වර්ෂවල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛණයේ අනුපිළිවෙල පදනම් කර ගෙන බඳවා ගනු ලැබේ. වසර කිහිපයකට අදාළ උපාධිධාරීන් අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවකදී ඒ ඒ වර්ෂයන්හි කුසලතා ලේඛණය පදනම් කර ගනිමින් එම කුසලතා ලේඛණයෙහි සඳහන් අනුපිළිවෙලට ප්‍රමුඛතාවය දෙමින් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

7.2.4.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : පත්කිරීම් බලධරයා විසින් (සුදුසුකම් සපුරා තිබේද යන්න සහ කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ.)

**7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :**

රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළ කිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් පළ කිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්

**08. කාර්යක්ෂමතා කඩඉම**

8.1

| *කාර්යක්ෂමතා කඩඉමද යන වග* | *කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද* | *කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත/වෘත්තීය/ සහතික පාඨමාලා /වෙනත්* |
|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියට පත්වී වසර 03ක් ගතවීමට පෙර | ලිඛිත පරීක්ෂණයකි. විෂය නිර්දේශය I පරිශිෂ්ඨයෙහි දැක්වේ. |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද :
වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :
විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පරිපාලන බලතල පවරන ලද දේශීය වෛද්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලබන ආයතනයක් විසින්

**09. භාෂා ප්‍රවීණතාවය :**

9.1

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු වේ. අ.පො.ස.(සා/පෙළ) මවුබස සඳහා සාමාර්ථ සුදුසුකමක් ලබා ගැනීම මේ සඳහා ප්‍රමාණවත් වේ. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාව ලබා ගත යුතුයි |

**10. ශ්‍රේණි උසස් කිරීම්**

10.1 ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

**10.1.1 සපුරාලිය යුතු සුදුසුකම්**

i. ප්‍රාථමික ශ්‍රේණියේ වසර 02ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දෙකක් (02) ක් උපයා ගෙන තිබීම.
ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දෙක (02) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
iii. කාර්යක්ෂමතා කඩඉම් විභාගය නියමිත දිනට සමත් වී තිබීම.

**10.1.2 උසස්වීම් ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

**10.2.1 පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහිත වෛද්‍ය නිලධාරීන් උසස් කිරීම**

**සපුරාලිය යුතු සුදුසුකම්**

i. පත්වීම ස්ථිර කර තිබීම.
ii. සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර හයක (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත කාලය තුළදී වැටුප් වර්ධක හයක් (06) ක් උපයා ගෙන තිබීම.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
iv. සේවා ව්‍යවස්ථාවේ II වන පරිශිෂ්ඨයෙහි දක්වා ඇති පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ පශ්චාත් උපාධි සුදුසුකමක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබා තිබීම සහ එම පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් එය සහතික කර තිබීම.
v. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම.

**10.2.2 පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා රහිත වෛද්‍ය නිලධාරීන් උසස් කිරීම**

**සපුරාලිය යුතු සුදුසුකම්**

i. පත්වීම ස්ථිර කර තිබීම
ii. සේවා ගණයේ දෙවන ශ්‍රේණියේ වසර දොළහක (12) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත කාලය තුළදී වැටුප් වර්ධක දොළහක් (12) උපයා ගෙන තිබීම.
iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.
iv. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්ව තිබීම.
v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළදී ලබා ගෙන තිබීම.

**10.2.3 උසස්වීම් ක්‍රමය :**

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය අනුව පත් කිරීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**10.3 ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියට උසස් කිරීම**

**10.3.1 සපුරාලිය යුතු සුදුසුකම්**

i. ආයුර්වේද වෛද්‍ය සේවයේ II ශ්‍රේණියේ වසර අටක (08) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක අටක් (08) උපයා ගෙන තිබීම හෝ ආයුර්වේද වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ නිලධාරියකු වීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii. III වන පරිශිෂ්ඨයේ දැක්වෙන අයුරු ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

iv. කළමණාකරන දෙපාර්තමේන්තුවේ අනුමත කරන ලද පර්යේෂණ/ ශික්ෂණ ආයුර්වේද රෝහලක, දිස්ත්‍රික් ආයුර්වේද රෝහලක / ග්‍රාමීය ආයුර්වේද රෝහලක, කාර්යභාර නිලධාරි / වෛද්‍ය අධිකාරි වශයෙන් වසර 03 කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. (ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියට හෝ I ශ්‍රේණියට අයත් තනතුරකට විධිමත් පරිදි පත්වීමක් හෝ වැඩ බැලීමේ පත්වීමක් ලබා සේවය කර ඇති සේවා කාලය ද සලකා බලනු ලැබේ.)

**10.3.2 උසස්වීම් ක්‍රමය**

තනතුරු පුරප්පාඩු ඇතිවන අවස්ථාවේ දී (සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට සහ ජූලි 01 දිනට) සේවයේ නියුතු 10.3.1 හි සඳහන් සුදුසුකම් සපුරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. පත්කිරීම් බලධරයා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම හා එයට අදාළ වන ලකුණු පරිපාටිය අනුමත කිරීම සිදු කරනු ලබන අතර, ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය ද සහිතව පත්කිරීම් බලධරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව උසස්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**10.4 ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ සිට පරිපාලන I ශ්‍රේණියට උසස් කිරීම**

**10.4.1 සපුරාලිය යුතු සුදුසුකම්**

i. ආයුර්වේද වෛද්‍ය සේවයේ පරිපාලන II ශ්‍රේණියේ වසර 03ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක තුනක් (03) ක් උපයාගෙන තිබීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii. III වන පරිශිෂ්ඨයේ දැක්වෙන පරිදි ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**10.4.2 උසස්වීම් ක්‍රමය**

තනතුරු පුරප්පාඩු ඇතිවන අවස්ථාවේ දී (සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට සහ ජූලි 01 දිනට) සේවයේ නියුතු සුදුසුකම්ලත් 10.4.1හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. පත්කිරීම් බලධරයා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම හා එයට අදාළ වන ලකුණු පරිපාටිය අනුමත කරනු ලබන අතර, ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ද සහිතව පත්කිරීම් බලධරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව උසස්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

**10.5 ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම**

**10.5.1 සපුරාලිය යුතු සුදුසුකම්**

i. ආයුර්වේද වෛද්‍ය සේවයේ II වන ශ්‍රේණියේ හෝ ඉන් ඉහළ ශ්‍රේණියක ආයුර්වේද වෛද්‍ය නිලධරයෙකු වීම.

ii. IV වන පරිශිෂ්ඨයේ දැක්වෙන අයුරු යම් විෂයයක් පිළිබඳව ශ්‍රී ලංකා රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයක අවුරුදු 03කට නොඅඩු පූර්ණ කාලීන ආයුර්වේද/සිද්ධ/යුනානි වෛද්‍ය විශාරද (Doctor of Medicine) හෝ ආයුර්වේද/සිද්ධ/යුනානි ශල්‍ය විශාරද (Master of Surgery) පශ්චාත් උපාධියක් ලබා තිබීම, හා අදාළ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් එය සහතික කර තිබීම .

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iv. ඉහත 10.5.1 හි i සහ ii හි සඳහන් සුදුසුකම් ලබා ගැනීමෙන් අනතුරුව හදාරන ලද විෂයයට අදාළව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ වසර 02 කට නොඅඩු පූර්ණකාලීන සායනික සහ පර්යේෂණ පුහුණුවක් ලබා ගැනීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයුර්වේද/සිද්ධ/යුනානි පශ්චාත් උපාධි ආයතනයක පිහිටුවනු ලබන අධ්‍යයන මණ්ඩලයේ (Board of Study) ලියාපදිංචි සහතිකයක් ( Board Certificate) ලබා තිබීම.

**සටහන :-** ඉහත 10.5.1 iv හි සඳහන් අධ්‍යයන මණ්ඩල පිහිටුවන තෙක් ඉහත 10.5.1 i සිට 10.5.1 iii දක්වා වන සුදුසුකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව හදාරන ලද විෂයට අදාළව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ විශේෂඥ වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ වසර 02 කට නොඅඩු පූර්ණ කාලීන සායනික හා පර්යේෂණ පුහුණුවක් ලබා තිබීම යන සුදුසුකම් පමණක් සලකා විශේෂඥ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

**10.5.2 උසස්වීම් ක්‍රමය :**

තනතුරු පුරප්පාඩු ඇතිවන අවස්ථාවේදී (සෑම වර්ෂයකම ජනවාරි 01 දිනට සහ ජූලි 01 දිනට) සේවයේ නියුතු 10.5.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද ආයුර්වේද වෛද්‍ය නිලධරයන් අතුරින් අයදුම්පත් කැඳවනු ලැබේ. පත්කිරීම් බලධරයා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීම හා එයට අදාළ වන ලකුණු පරිපාටිය අනුමත කරනු ලබන අතර, ඒ අනුව අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ ද සහිතව පත්කිරීම් බලධරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව උසස්වීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

11. *තනතුරුවලට පත් කිරීම* : V පරිශිෂ්ටය අදාළ වේ.

12. *සේවයට අදාළ කොන්දේසි :*

12.1 සේවය ස්ථිර කිරීමේ කොන්දේසි :

ප්‍රාථමික ශ්‍රේණියට බඳවා ගනු ලබන ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පත්වීම ස්ථිර කිරීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීති රීති හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති අනුව සිදු කරනු ලැබේ.

12.1.2 පත්වීම ස්ථිර කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා සිටීම අත්‍යවශ්‍ය වේ.

i. පරිවාස කාලය තුළ සේවය සතුටුදායක වීම.
ii. පරිවාස කාලය තුළ උපයා ගත යුතු සියලුම වැටුප් වර්ධක උපයා ගෙන සිටීම.
iii. කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් සමත්ව සිටීම.

12.2 මෙම ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානවලට අමතරව ආයතන සංග්‍රහයේ පළමුවන හා දෙවන කාණ්ඩවල විධිවිධාන ද මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1589/30 හා 2009.02.20 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති ද රජය විසින් වරින්වර පනවනු ලබන නියමයන් හා නියෝග ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට හා චක්‍රලේඛවලට ආයුර්වේද වෛද්‍ය සේවයේ සෑම නිලධාරියෙකුම යටත් වේ.

12.3 ආයුර්වේද වෛද්‍ය නිලධරයන් සේවයට බඳවා ගනු ලබන්නේ දීප ව්‍යාප්තව ඇති තනතුරුවල සේවය කිරීමට බැවින් සේවයට බඳවා ගනු ලබන කවර නිලධරයෙකුට වුවද, දිවයිනේ ඕනෑම සේවා ස්ථානයක සේවය කිරීමට යටත්වේ.

12.4 ස්ථාන මාරු

සියලු ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ස්ථාන මාරු පරිපාටිය අනුව සිදු කෙරේ.

13. අර්ථ නිරූපණ හා නිර්වචනයන්

*(අ)* "සේවා ව්‍යවස්ථාව" යනුවෙන් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අදහස් කෙරේ.
*(ආ)* "කොමිෂන් සභාව "යනුවෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් කෙරේ.
*(ඇ)* "සේවය" යනුවෙන් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය අදහස් කෙරේ.
*(ඈ)* "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් දේශීය වෛද්‍ය විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් අදහස් කෙරේ.
*(ඉ)* "ආයුර්වේද කොමසාරිස්" යනුවෙන් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා යන්න අදහස් කෙරේ.
*(ඊ)* "අමාත්‍යාංශය" යනුවෙන් දේශීය වෛද්‍ය විෂය භාර රේඛීය අමාත්‍යාංශය අදහස් වේ.
*(උ)* සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත්, නිලධාරියකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ.

**14. ආයුර්වේද වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය**

i. සේවා කාලය ගණනය කරනු ලබන්නේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර ගෙනය. කෙසේ වෙතත් අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වන වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීම ද සිදු නොකළ යුතුය.

ii. මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට ආයුර්වේද වෛද්‍ය සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අන්තර්ග්‍රහණ විධිවිධාන අදාළ වේ. නියමිත දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති වැටුප් පරිමාණ යටතේ වැටුප් ලබන ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සියලු දෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මකවන දිනට ආයුර්වේද වෛද්‍ය සේවයේ ,

*(අ)* ප්‍රාථමික ශ්‍රේණියේ සේවයේ යෙදී සිටින නිලධාරීන් ප්‍රාථමික ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
*(ආ)* II ශ්‍රේණියේ සේවයේ යෙදී සිටින නිලධාරීන් II වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
*(ඇ)* I ශ්‍රේණියේ සේවයේ යෙදී සිටින නිලධාරීන් I වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.
*(ඈ)* විශේෂඥ ශ්‍රේණියේ සේවයේ යෙදී සිටින නිලධාරීන් විශේෂඥ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

**15. අන්තර්කාලීන විධිවිධාන**

15.1 1996.01.01 දිනෙන් ක්‍රියාත්මක වූ සේවා ව්‍යවස්ථාව අනුව බඳවා ගන්නා ලද ආයුර්වේද ඩිප්ලෝමාධාරීන්ගෙන් අවසාන ඩිප්ලෝමාධාරී වෛද්‍ය නිලධාරියා ප්‍රාථමික ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වන තුරු 1996.05.20 දිනැති අංක 924/2 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ ප්‍රාථමික ශ්‍රේණියට අන්තර්ග්‍රහණ විධිවිධාන එලෙසින්ම බල පැවැත්වෙනු ඇත.

15.2 මෙම අන්තර්කාලීන විධිවිධාන අදාළ වන්නේ, නව සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමට පෙර පැවැති 1996.05.20 දිනැති අංක 924/2 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* සඳහන් ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවා ව්‍යවස්ථාව යටතේ බඳවා ගත් නිලධාරීන් සඳහා පමණි.

16 විධිවිධාන සලසා නොමැති කරුණු :

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සැලසී නොමැති කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17 වෙනත්

මෙම සේවා ව්‍යවස්ථාවෙහි සිංහල, දෙමළ, ඉංග්‍රීසි පිටපත්වල කරුණු අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

## I පරිශිෂ්ඨය

1.1 විභාගයේ නම : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

1.2 විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. මූල්‍ය ක්‍රම | පැය 02 | 100 | 40 |
| 2. ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික නීති සංග්‍රහය | පැය 02 | 100 | 40 |
| 3. ආරෝග්‍ය ශාලා පරිපාලනය | පැය 02 | 100 | 40 |

1.3 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. මූල්‍ය ක්‍රම | (අ) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය ( X වැනි පරිච්ඡේදය හැර) |
| 2. ආයතන රෙගුලාසි හා කාර්ය පරිපාටික නීති සංග්‍රහය | (අ) ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය |
| 3. ආරෝග්‍ය ශාලා පරිපාලනය | (අ) ආරෝග්‍යශාලා පිළිබඳ බල පැවැත්වෙන සාමාන්‍ය නීතිරීති.<br>(ආ) ආරෝග්‍යශාලා පිරිසිදුව තබා ගැනීම.<br>(ඇ) රෝගීන් සම්බන්ධව බල පැවැත්වෙන නීතිරීති.<br>(ඈ) රෝගීන්ට නියමිත ආහාර පාන ලබා ගන්නා විධි .<br>(ඉ) ඖෂධ නිෂ්පාදනාගාර පාලනය.<br>(ඊ) රෝගීන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් බලපැවැත්වෙන නීති රීති.<br>(උ) ආරෝග්‍යශාලාවල වෛද්‍ය අධිකාරියේ සිට කනිෂ්ඨ සේවකයින් දක්වා ඔවුන්ට අයත් රාජකාරි පිළිබඳ අවබෝධය.<br>(ඌ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පාලන රෙගුලාසි.<br>(එ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ගබඩාවල ගිණුම්, ලිපි ලේඛන, පොත්පත් පවත්වාගෙන යාමට අදාළ රෙගුලාසි.<br>(ඔ) ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සංවිධාන සංග්‍රහය. |

II පරිශිෂ්ටය

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් කර ඇති, ආයුර්වේද වෛද්‍ය සේවයේ පළමුවන ශ්‍රේණියට උසස් කරනු ලැබීම සඳහා ආයුර්වේද වෛද්‍ය නිලධරයන් විසින් පහත විෂය ක්ෂේත්‍රයට අදාළව යටත් පිරිසෙයින් එක් අධ්‍යයන වර්ෂයක පශ්චාත් උපාධි ඩිප්ලෝමා හෝ ඊට ඉහළ උපාධි පාඨමාලාවක් හදාරා තිබිය යුතුයි. මෙම පශ්චාත් උපාධි ඩිප්ලෝමාව / පශ්චාත් උපාධි පාඨමාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් / පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයකින් ලබා ගත යුත්තක් විය යුතුය.

**නිර්දේශිත විෂයයන් :**

1) ශල්‍ය තන්ත්‍රය - විදුම් පිළිස්සුම්, දැවුම් පිළිස්සුම්, කැඩුම් බිඳුම්, ගෙඩි වන වෙදකම. සාමාන්‍ය ශල්‍ය චිකිත්සාව, ක්ෂාර කර්ම, අග්නි කර්ම, ගුදගත රෝග, මූත්‍ර රෝග, ජලෞකා චිකිත්සාව ඇතුළු ශල්‍ය චිකිත්සාව

2) ශාලාක්‍ය තන්ත්‍රය - දන්ත චිකිත්සාව, අක්ෂි රෝග, ශිරෝ රෝග, සාමාන්‍ය ශාලාක්‍ය චිකිත්සාව, කර්ණ, නාසා, උගුර පිළිබඳව

3) කාය චිකිස්සාව - සාමාන්‍ය කාය චිකිත්සාව, රෝග නිවාරණය, මානසික රෝග චිකිත්සාව, පංච කර්ම, වාත රෝග, චර්ම රෝග, සන්ධි රෝග ඇතුළු කාය චිකිත්සාව හා සම්බන්ධ රෝග

4) භූත විද්‍යාව - භූත විද්‍යාව ප්‍රතිකාර ක්‍රම, ජ්‍යොතිෂය, සත්වාවජය හා දෛව ව්‍යාපාශ්‍රය චිකිත්සාව

5) කෞමාරභෘත්‍යය - කුමාර චිකිත්සා, ප්‍රසූති, ස්ත්‍රී රෝග

6) අගද තන්ත්‍රය - විෂ චිකිත්සාව, සාමාන්‍ය අගද තන්ත්‍රය

7) ස්වස්ත වෘත චිකිත්සාව - ස්වස්ත වෘත සාමාන්‍ය චිකිත්සාව, ප්‍රජා සෞඛ්‍ය, යෝග

8) ද්‍රව්‍ය ගුණ විඥානය - රස ශාස්ත්‍රය, ද්‍රව්‍ය ගුණ, භෛෂජ්‍ය කල්පනා

9) රසායන තන්ත්‍රය

10) වාජීකරණ තන්ත්‍රය

11) ආයුර්වේද රෝහල් කළමනාකරණය

12) ඉහත දැක්වෙන විෂයන් 11ට පරිබාහිර වෙනත් විෂයන්ට අදාළව රජයේ අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය මත හදාරා ඇති පශ්චාත් උපාධි හෝ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවන් සම්බන්ධයෙන් රජයේ අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශ මත පළමු ශ්‍රේණියට උසස් කිරීම සලකා බලනු ලැබේ.

## III පරිශිෂ්ඨය

**පරිපාලන I ශ්‍රේණිය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක්, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයකින් ලබා ගත් වසර දෙකකට නොඅඩු ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පරිපාලන II ශ්‍රේණිය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් දේශීය හෝ විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක්, පශ්චාත් උපාධි අධ්‍යයන ආයතනයක් හෝ විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ආයුර්වේද රෝහල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

## IV පරිශිෂ්ඨය

**විශේෂඥ ශ්‍රේණිය**

"වෛද්‍ය විශේෂඥ" යන පදයෙන් අදහස් කරනුයේ 1961 අංක 31 දරන ආයුර්වේද පනතෙහි "ආයුර්වේද" යන්න නිර්වචනය කර ඇති වෛද්‍ය ක්‍රමයට අනුකූලවන ලෙස

1) කාය චිකිත්සා/ පොදු මරුත්තුවම්/ මොඅලජත් (General Ayurveda / Siddha /Unani Medicine)
2) ස්වස්ථ වෘත්ත/ සමූකමරුත්තුවම්/ තහෆ්ෆුදී වසමාජී තිබ් (Community Medicine)
3) ද්‍රව්‍ය ගුණ විඥානය/ කුණපාඩම්/ ඉල්මුල් අද්වියා (Materia Medica)
4) ශල්‍ය තන්ත්‍රය/ අරුවෛමරුත්තුවම්/ ජරාහත් (Ayurveda / Siddha/Unani Surgery)
5) ශාලක්‍ය තන්ත්‍රය (Ayurveda / Siddha/Unani ENT & Ophthalmology)
6) කෞමාරභෘත්‍ය (බාල රෝග)/ කුලන්තෛමරුත්තුවම්/ අම්රාස් ඒ නිස්වාන් ව කබාලත් (Ayurveda/Siddha/Unani Pediatrics)
7) ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග/ මහලිර් සහ සූල් මරුත්තුවම්/ (Ayurveda/Siddha/Unani Gynecology and Obstetrics)
8) භූත විද්‍යාව (Ayurveda/Siddha/Unani Demenology)
9) අගද තන්ත්‍ර /නන්ජුමරුත්තුවම් / (Ayurveda/Siddha/Unani Toxicology)
10) දේශීය චිකිත්සා (Indigenous Medicine)

යන අංශවලට ගැනෙන යම් විෂයයක් පිළිබඳව ශ්‍රී ලංකා රජය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයක වසර 03 කට නොඅඩු පූර්ණ කාලීන පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදෑරීම හා ඉන් පසුව විෂයයට අදාළව විශේෂඥ වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ වසර 02 කට නොඅඩු පූර්ණ කාලීන සායනික/ පර්යේෂණ/ පුහුණුවක් ලබාගැනීමෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයුර්වේද /සිද්ධ/ යුනානි පශ්චාත් උපාධි ආයතනයක පිහිටවනු ලැබූ අධ්‍යයන මණ්ඩලයක (Board of Study) ලියාපදිංචි සහතිකයක් (Board Certificate) ලබා තිබීම.

එමෙන්ම ඉහතින් දක්වා ඇති ප්‍රධාන විෂයයන් 10 ට අයත් උප විෂයයන් සඳහා ඉදිරියේ දී පිරිනමනු ලබන එම්.ඩී/ එම්.එස් ආයුර්වේද/සිද්ධ/ යුනානි පශ්චාත් උපාධි ද විශේෂඥ ශ්‍රේණිය සඳහා නිර්දේශ කෙරේ.

| *විශේෂඥතාවය* | *පිළිගත් සුදුසුකම්* |
| --- | --- |
| 1. කාය චිකිත්සා | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී.උපාධිය ලබා ගැනීම<br>කාය චිකිත්සා (General Ayurveda Siddha / Unani Medicine) කාය චිකිත්සා පංචකර්ම (Panchakarma), කායචිකිත්සා විකෘති විඥාන (Ayurveda/ Siddha / Unani Pathology), කාය චිකිත්සා<br>රසායන වාජීකරණ (Rejuvenation and Aphrodisiac) |

| *විශේෂඥතාවය* | *පිළිගත් සුදුසුකම්* |
|---|---|
| 2. ස්වස්ථ වෘත්ත | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. ස්වස්ථ වෘත්ත (Ayurveda/ Siddha / Unani Community Medicine) පෝෂණය (Ayurveda / Siddha/ Unani Nutrition) |
| 3. ද්‍රව්‍ය ගුණ විඥානය | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. ද්‍රව්‍ය ගුණ විඥාන (Ayurveda /Unani Pharmacology) භෛෂජ්‍ය කල්පනා (Ayurveda / Siddha / Unani Pharmaceutics), රස ශාස්ත්‍රය (Ayurveda / Siddha/Unani Alchemy) |
| 4. ශල්‍ය තන්ත්‍රය | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/යුනානි, අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. ශල්‍ය තන්ත්‍රය (Ayurveda /Siddha/Unani Surgery), ශල්‍ය සංඥහරණ (Ayurveda / Siddha/ Unani Anesthesiology), පාරාශල්‍ය ක්‍රම (Ayurveda / Siddha/ Unani Para Surgical Procedures) |
| 5. ශාලාක්‍ය තන්ත්‍රය | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. ශාලාක්‍ය තන්ත්‍රය(Ayurveda/ Siddha/ Unani ENT), අක්ෂි රෝග (Ayurveda/ Siddha/ Unani Ophthalmology), මුඛ රෝග (Ayurveda/ Siddha/ Unani Oral Diseases) & Siddha/ Unani Alchemy) |
| 6. කෞමාරභෘත්‍ය (බාල රෝග) | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකක් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. කෞමාරභෘත්‍ය (බාලරෝග) (Ayurveda/ Siddha/ Unani Pediatrics) |
| 7. ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. ප්‍රසූතිතන්ත්‍ර සහ ස්ත්‍රී රෝග (Ayurveda/ Siddha/ Unani Gynecology and Obstetrics) |
| 8. භූත විද්‍යාව | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. භූත විද්‍යාව සහ මනෝ රෝග (Ayurveda/ Siddha/ Unani Demenology) |
| 9. අගද තන්ත්‍ර | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. අගද තන්ත්‍ර (Ayurveda/ Siddha/ Unani Toxicology) |
| 10. දේශීය චිකිත්සා | පහත සඳහන් ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද/සිද්ධ/ යුනානි අංශයෙන් එම්.ඩී. උපාධිය ලබා ගැනීම. කැඩුම්බිඳුම් චිකිත්සා, ගෙඩි වන චිකිත්සා, දැවුම් පිළිස්සුම් චිකිත්සාව, විදුම් පිළිස්සුම් චිකිත්සාව, කටු චිකිත්සාව, ඇස් වෙදකම, සර්ප වෙදකම, සර්ප විෂ චිකිත්සාව |

ආයුර්වේද පර්යේෂණායතනයේ වෛද්‍ය නිලධර (පර්යේෂණ) ගණය සහ දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ වෛද්‍ය නිලධර (අධ්‍යාපන) ගණය, විශේෂඥ ශ්‍රේණියට උසස් කිරීම සඳහා ඉහත සඳහන් පශ්චාත් උපාධි සුදුසුකම් වලට අමතරව පහත සඳහන් කරනු ලබන පශ්චාත් උපාධි සුදුසුකම් ද නිර්දේශ කෙරේ.

ආයුර්වේද මූලධර්ම හා ශරීර විඥාන යන ක්ෂේත්‍ර අතුරින් එකකින් ආයුර්වේද / සිද්ධ / යුනානි අංශයේ එම්.ඩී. උපාධිය ලබා ගැනීම.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.